# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ඇබෑර්තු - 2025

---

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2026 ජනවාරි මස 05** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය).

### 1 නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) - [පුරප්පාඩු සංඛ්‍යාව - 01]

#### 1.1 වැටුප් පරිමාණය:-

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව, මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 109,090 7x 2,940 / 6x3,900 153,070/- වේ (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.184,000/- පමණ වේ). [ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2026 සහ 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

#### 1.2 වයස් සීමාව:-

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

#### 1.3 අධ්‍යාපන සුදුසුකම්:-

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන වාණිජ්‍යය, කළමනාකරණය හෝ ගණකාධිකරණය පිළිබඳ උපාධියක් තිබීම.

#### 1.4 වෘත්තීය සුදුසුකම්:-

අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් / ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) පිරිනමන ලද මූල්‍ය කළමනාකරණය/ගණකාධිකරණය/ප්‍රසම්පාදන යන ක්ෂේත්‍රයන්හි ශාස්ත්‍රපති උපාධියක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

ආ) මුදල් අමාත්‍යාංශය/ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) විසින් මෙහෙයවනු ලබන CIGAS සහ ITMIS, පරිගණක වැඩසටහන් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

## **1.5 පළපුරුද්ද:-**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III/II ශ්‍රේණිවල එකතුව වසර දොළහක් වූ (12) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

## **1.6 බඳවා ගැනීමේ ක්‍රමය:-**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතාවය මත.

**පරීක්ෂණ පටිපාටිය:-**

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම් සපුරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. ඒ සඳහා වෙන්කර ඇති මුළු ලකුණු සංඛ්‍යාව සියයකි (100):-

| අනු අංකය | නිර්ණායක |
|---|---|
| 1 | අමතර අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | සේවා පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

## **2 කාර්මික නිලධාරි (විදුලි) - [පුරප්පාඩු සංඛ්‍යාව - 02]**

## **2.1 වැටුප් පරිමාණය:**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 58,660 – 9 x 1,190 / 3 x 1,360 – 73,450/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 97,000/- පමණ වේ). [ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2026 සහ 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

## **2.2 වයස් සීමාව:**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

## **2.3 අධ්‍යාපන සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ගණිතය විෂයය ධාරාව යටතේ විෂයයන් හතරකින් (පැරණි නිර්දේශය) හෝ නව විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් එක් වරක දී සමත් වී තිබීම.

සහ

සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට, ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සහ ගණිතයට සම්මාන සාමාර්ථ ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබීම.

**2.4 වෘත්තීය සුදුසුකම්:**

(i) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT)
(විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ)
හෝ
(ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE)
(විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ)
හෝ
(iii) ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES)
(විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ)
හෝ
(iv) විවෘත විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ඩිප්ලෝමාව
(විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ)
හෝ
(v) විදුලි/ ඉලෙක්ට්‍රොනික්/ විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළව NVQ 6 සහතිකයක් ලබා තිබීම.

**2.5 පළපුරුද්ද:**

පිළිගත් ආයතනයක, ඉලෙක්ට්‍රොනික/ ශ්‍රව්‍ය/දෘශ්‍ය/ විදුලි සංදේශ/ විකාශනය/ වායු සමීකරණ හා ශීතකරණ හෝ සමාන ක්ෂේත්‍රයක කාර්මික නිලධාරියෙකු ලෙස වසර තුනකට නොඅඩු පළපුරුද්ද.

**2.6 බඳවා ගැනීමේ ක්‍රමවේදය සහ පරීක්ෂණ පටිපාටිය :**

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි. සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

| අනු අංකය | නිර්ණායක |
|---|---|
| 01 | අමතර අධ්‍යාපන සුදුසුකම් |
| 02 | අමතර වෘත්තීය සුදුසුකම් සහ විශේෂ කුසලතා |
| 03 | සේවා පළපුරුද්ද |
| 04 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව |

**3 භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි/සිංහල) - [පුරප්පාඩු සංඛ්‍යාව 05]**
**භාෂා පරිවර්තක (සිංහල/දෙමළ/සිංහල) - [පුරප්පාඩු සංඛ්‍යාව 02]**
**භාෂා පරිවර්තක (ඉංග්‍රීසි / දෙමළ/ඉංග්‍රීසි) - [පුරප්පාඩු සංඛ්‍යාව 03]**

**3.1 මාසික වැටුප් පරිමාණය:-**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරුවලට හිමි මාසික වැටුප් පරිමාණය රු. 54,560-3 x 680/10 x 800/4 x1,190 - 69,360/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 92,000.00 පමණ වේ). [ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2026 සහ 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

දැනටමත් රජයේ සේවයේ නියුතු සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවකු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සඳහා, වසරක වැඩබැලීමේ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ඔහුගේ/ඇයගේ වැටුප් පියවර පෙර වැටුප අනුව සකස් කරනු ලැබේ.

## 3.2 වයස් සීමාව:-

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

## 3.3 අධ්‍යාපන සුදුසුකම්:-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එකවර විෂයයන් 04ක් සමත් වී තිබීම (පැරණි නිර්දේශය) / එකවර විෂයයන් 03ක් සමත් වී තිබීම (නව නිර්දේශය);

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය විෂයය සහ අදාළ භාෂා විෂයය ධාරා ඇතුළත්ව විෂයයන් 5ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම.

(අදාළ භාෂා විෂය ධාරාවන් - භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි/සිංහල) තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට සිංහල සහ ඉංග්‍රීසි භාෂා සඳහා සම්මාන සාමාර්ථ ද, භාෂා පරිවර්තක (සිංහල/දෙමළ/සිංහල) තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට සිංහල සහ දෙමළ භාෂා සඳහා සම්මාන සාමාර්ථ ද, භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ/ඉංග්‍රීසි) තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට ඉංග්‍රීසි සහ දෙමළ භාෂා සඳහා සම්මාන සාමාර්ථ ද තිබිය යුතුය).

## 3.4 වෘත්තීය සුදුසුකම්:-

පරිගණක සාක්ෂරතාවය පිළිබඳව පිළිගත් ආයතනයකින් සහතිකයක් ලබා තිබීම.

## 3.5 පළපුරුද්ද:-

ඉහත සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව රජයේ හෝ පිළිගත් ආයතනයක භාෂා පරිවර්තක තනතුරක වසර 5කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

## 3.6 බඳවා ගැනීමේ ක්‍රමය:-

ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

(අ) ලිඛිත පරීක්‍ෂණය

ඉහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට සහභාගි විය යුතුය. මෙම පරීක්ෂණය මඟින් භාෂා පරිවර්තනය පිළිබඳ අයදුම්කරුවන්ගේ කුසලතා ඇගයීමට ලක් කෙරේ. මෙම පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

(ආ) සම්මුඛ පරීක්‍ෂණය

ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහි දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| අනු අංකය | නිර්ණායක |
|---|---|
| 1 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |
| 4 | සන්නිවේදන කුසලතා |
| 5 | පළපුරුද්ද |

**4 රෙදිපිළි කාමර සේවක - [පුරප්පාඩු සංඛ්‍යාව - 01]**

**4.1 රාජකාරී ස්වභාවය**

පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයෙහි නිල ඇඳුම්, තිර රෙදි ඇතුළු රෙදිපිළිවල පිරිසිදුකම සහ නඩත්තුව සහතික කිරීමට අදාළව ආහාරපාන හා ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කටයුතු ඉටු කිරීම මෙම තනතුර හරහා අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, මෙම තනතුරට අදාළ ප්‍රධාන වගකීම් ලෙස නිල ඇඳුම් ඇතුළු රෙදිපිළි පිරිසිදු කිරීම, අලුත්වැඩියා කිරීම සහ නිකුත් කිරීම අධීක්ෂණය කිරීම, රෙදිපිළි සම්බන්ධ වාර්තා හා තොග මට්ටම් නිවැරදිව පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා පවත්වාගෙන යාම, රෙදි සෝදන බිල්පත් පරීක්ෂා කිරීම සහ අවශ්‍ය පරිදි රෙදිපිළි කාලෝචිත ලෙස බෙදා හැරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළත් වේ.

**4.2 මාසික වැටුප් පරිමාණය**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 42,290-9x490/10x540/6x590-55,640/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.80,000/- ක් පමණ වේ). [ඉහත සඳහන් චක්‍රලේඛයට අනුව 2026 සහ 2027 සඳහා තවදුරටත් වැටුප් සංශෝධන සිදු කිරීමට නියමිතය].

**4.3 වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

**4.4 අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුද්ද**

(අ) සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

හෝටල් ගෘහපාලන ක්ෂේත්‍රයේ NVQ II මට්ටමේ සහතිකයක් ලබා තිබීම.

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අනුමත තරු පන්තියේ හෝටලයක රෙදිපිළි කාමර සේවක තනතුරෙහි හෝ රෙදි සේදුම් කර්මාන්ත (ලොන්ඩරි) සේවකයෙකු ලෙස මාස හයකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම

**<u>හෝ</u>**

(ආ) සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අනුමත තරු පන්තියේ හෝටලයක රෙදිපිළි කාමර සේවක තනතුරෙහි හෝ රෙදි සේදුම් කර්මාන්ත (ලොන්ඩරි) සේවකයෙකු ලෙස වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම

****ඉහත සුදුසුකම් වලට අමතරව මැහුම් ගෙතුම් පිළිබඳව ප්‍රායෝගික දැනුම අනිවාර්ය වේ.**

## <u>4.5</u> <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(අ) ලිඛිත/වෘත්තීය පරීක්ෂණය

උක්ත තනතුර සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් මෙම ලිඛිත/වෘත්තීය පරීක්ෂණයට මුහුණ දිය යුතුය. මෙහිදී රෙදිපිළි ගබඩා කිරීම, රෙදිපිළි සේදීම, රෙදි මැසීම යන ක්ෂේත්‍රයන්ට අදාළව අයදුම්කරුවන්ගේ කුසලතා නිර්ණය කිරීම සිදු කරනු ලැබේ. මෙහි දී පැය 1 ක ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එකී පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(ආ) සම්මුඛ පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහි දී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි:

| අනු අංකය | නිර්ණායක |
|---|---|
| 1 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

## <u>5</u> සේවා නියමයන් හා කොන්දේසි

(i) මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරු වලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සේවයේ ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

(ii) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතුය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(vi) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

**6** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය
ii. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
iii. අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
iv. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
v. පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**7** රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**8** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**9** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමෙකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**10** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන (දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන්නේ නම්) හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**11** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර**
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ
2025 දෙසැම්බර් මස වැනි දින

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ආදර්ශ අයදුම්පත්‍රය

### ............................................ තනතුර

1. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ...........................................................................

   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ...........................................................................

   (ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (මහතා/මහත්මිය/මෙනෙවිය) ........................................

   ...........................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3. (අ) (i) පෞද්ගලික ලිපිනය : ...........................................................................

   ...........................................................................

   ...........................................................................

   (ii) විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) : ...........................................................................

   (iii) දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (iv) Whatsapp දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (ආ) (i) කාර්යාලයීය ලිපිනය : ...........................................................................

   ...........................................................................

   ...........................................................................

   (ii) දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (ඇ) විභාග ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ලිපිනය සඳහන් කරන්න.

   පෞද්ගලික ☐ රාජකාරි ☐

4. (අ) උපන් දිනය : වර්ෂය ............... මාසය............... දිනය ...............

   (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය)

   (ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු ............... මාස ............... දින ...............

5. විවාහක/අවිවාහක බව : ...........................................................................

6. ස්ත්‍රී /පුරුෂ භාවය : ...........................................................................

7. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/ නැත)

8. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතුය)

| උපාධිය | ආයතනය | ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

| විභාගය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස. (උ/ පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |
| අ.පො.ස. (සා/ පෙළ) | සිංහල / දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතුය)

| පාඨමාලාව | ආයතනය | කාල පරිච්ඡේදය | ක්‍රියාත්මක වන දිනය **(Effective date)** |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. වෙනත් සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතුය)

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

11. පළපුරුද්ද (සහතිකවල පිටපත් අමුණා තිබිය යුතුය)

| ආයතනය | තනතුර | සේවා කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර (අදාළ ලේඛන අමුණා තිබිය යුතුය)

(අ) ආයතනයේ නම හා ලිපිනය : ..........................................................................
..........................................................................
..........................................................................

(ආ) මුල් පත්වීමේ දිනය : ..........................................................................

(ඇ) දැනට දරන තනතුර : ..........................................................................

(ඈ) මාසික මූලික වැටුප : ..........................................................................

(ඉ) දීමනා : ..........................................................................

(ඊ) දළ වැටුප : ..........................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත්ද? (ඔව්/ නැත)

එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න : ..........................................................................
..........................................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද? (ඔව්/ නැත)

එසේ නම්, ඒ පිළිබඳ විස්තර දක්වන්න : ..........................................................................
..........................................................................................................................

*ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුසුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත්, වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.*

දිනය : ................................ ...........................................................

අයදුම්කරුගේ අත්සන

---

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

**(රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ...................................... තනතුර දරන ...................................................... මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය : .................................... ...........................................................

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)